**ආබාධිතයන් සඳහා වූ ජාතික ක්‍රීඩා සම්මේලනය - 2024**

**------------------------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 වියාචනය කල මතය**

ආබාධිතයන් සඳහා වූ ජාතික ක්‍රීඩා සම්මේලනයේ (“සම්මේලනය”) 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ අදායම් ප්‍රකාශනය ,සමුච්චිත අරමුදල් ප්‍රකාශනය , එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මුදල් ප්‍රවාහ_ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාල සටහන් වලින් සමන්විත ප්‍රමාණාත්මක ගිණුම් කරණ ප්‍රතිපත්ති වලට අදාල තොරතුරු ද ඇතුලත් 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමග සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනත සහ 1993 අංක 47 දරන ක්‍රීඩා (සංශෝධන) පනතේ 9වන වගන්තිය මඟින් සංශෝධිත 1973 අංක 25 දරණ ක්‍රීඩා පනතේ 21 (අ) වගන්තියේ ඇතුලත් විධි විධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මා විසින් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කල යුතු යයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ .

සම්මේලනයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මා හට නොහැකි විය.

**1.2 වියාචනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ විස්තර කරනු ලබන කරුණු මත පදනම්ව මා විසින් මතයක් ප්‍රකාශ කරනු නොලැබේ. මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ,ආදායම් ප්‍රකාශනයේ, සමුච්චිත අරමුදල් ප්‍රකාශනයේ සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ඇතුලත් ප්‍රමාණාත්මක අයිතම විකල්ප ක්‍රම මගින් තහවුරු කිරීමට හෝ සත්‍යාපනය කිරීමට මට නොහැකි විය.

මේ හේතුවෙන්,මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය,ආදායම් ප්‍රකාශනය, සමුච්චිත අරමුදල් ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනවල වාර්තාගත හෝ වාර්තා නොකළ වටිනාකම් සම්බන්ධයෙන් කිසියම් ගැලපීමක් කිරීමට අවශ්‍ය දැයි මට නිශ්චය කිරීමට නොහැකි විය.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන කුඩා හා මධ්‍ය පරිමාණ අස්ථිත්වයන් සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට (SLFRS for SMES ) අනුකූලව පිළියෙළ කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී , සම්මේලනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර ,කළමනාකාරිත්වය සම්මේලනය ඈවර කිරීමට අදහස් කරන්නේනම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සම්මේලනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.
සම්මේලනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව, සම්මේලනයේ වාර්ෂික සහ කාලින මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකිවන පරිදි සම්මේලනයේ ආදායම,වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය

**1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම )**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව සම්මේලනයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණනය කිරීම හා විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ වගකීම වේ. කෙසේ වුවද, මෙම වාර්තාවේ 1.5 ඡේදයේ විස්තර කරනු ලබන කරුණු හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.5.1 ගිණුම්කරණ අඩුපාඩු**

| **විගණන නිරීක්ෂණ** | **කළමණාකාරිත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| 2025 වර්ෂය සඳහා ගෙවන ලද රු. 107,000 ක් වටිනා ජාත්‍යන්තර පැරාලිම්පික් කමිටුවේ (IPC) බලපත්‍ර ගාස්තුව සමාලෝචිත වර්ෂය සඳහා වියදමක් ලෙස හඳුනාගෙන තිබුණි. එබැවින්, වසරේ අතිරික්තය රු. 107,000 කින් අඩුවෙන් දක්වා තිබුණි. | එකඟ වන අතර නිවැරදි කරමි. | ගිණුම්කරණ කාල සීමාව සඳහා වන වියදම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්වල හඳුනාගත යුතුය. |

**1.5.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොමැතිවීම**

| **විෂයය** | **මුදල රු** | **සාක්ෂි නොමැති වීම** | **කළමණාකාරිත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|---|
| මාර්ගගත ගෙවීම් 13 | 20,862,767 | ගෙවීම් වවුචර් | අපි වවුචර් සකස් කළත්, ඒවා විගණනය සඳහා ඉදිරිපත් කිරීමට අපට නොහැකි විය. | ගෙවීම්වල නිරවද්‍යතාවය සත්‍යාපනය කිරීම සඳහා සියලුම ලේඛනමය සාක්ෂි සැපයිය යුතුය. |

**1.6 නීති,රීති,රෙගුලාසි සහ කළමණාකාරිත්වයේ තීරණ වලට අනුකූල නොවීම**

| **නීති,රීති,රෙගුලාසි යනාදියට යොමුව** | **අනුකූල නොවීම** | **කළමණාකාරිත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) 1973 අංක 25 දරන ක්‍රීඩා නියෝග V කොටසේ 40 වන වගන්තිය | සමාලෝචිත වර්ෂය තුළ විදේශ රටවල පැවති ජාත්‍යන්තර තරඟාවලි 16 ක් සඳහා ක්‍රීඩකයින් සහභාගී වී තිබුණි. කෙසේ වෙතත්, තරඟාවලි 10 ක් සඳහා ක්‍රීඩා අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. | පිළිතුරු දී නොමැත | **සම්මේලනය ක්‍රීඩා නියෝග වලට අනුකූල විය යුතුය.** |
| (ආ) 2024 මැයි 03 දිනැති අංක 2382/32 දරන අතිවිශේෂ ගැසට් නිවේදනය මගින් ප්‍රකාශයට පත් කරන ලද 2024 අංක 01 දරන ජාතික | මෙම රෙගුලාසි ක්‍රියාත්මක වන දින සිට මාස 03ක් ඇතුළත, වත්මන් ජාත්‍යන්තර ශ්‍රේණි මට්ටම වැඩිදියුණු කිරීම සඳහා උපාය මාර්ග, අදාළ කාල සීමාව තුළ අපේක්ෂිත ඉලක්ක සහ කාර්ය සාධන මට්ටම ඇතුළත් සංයුක්ත සැලැස්මක් සම්මේලනය | සම්මේලනය විගණන නිරීක්ෂණය සමඟ එකඟ වී ඇත. | **සම්මේලනය ක්‍රීඩා නියෝග වලට අනුකූල විය යුතුය.** |

| | |
|---|---|
| ක්‍රීඩා සංගම් නියෝග II කොටසේ 3 (1) (ii) වගන්තිය | විසින් ඉදිරිපත් කළ යුතු අතර, එය ක්‍රීඩා අධ්‍යක්ෂ ජනරාල් වෙත අනුමැතිය සඳහා ඉදිරිපත් කළ යුතුය. කෙසේ වෙතත්, සම්මේලනය එසේ කිරීමට අපොහොසත් වී තිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 2,188,855ක ඌණතාවයක් වූ අතර ඊට ප්‍රතිවිරුද්ධව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 2,229,145ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයේ රු. 4,418,000ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට ප්‍රධාන හේතුව වූයේ පෙර වසරට සාපේක්ෂව ක්‍රීඩා ඉසව් වියදම් රු. 15,946,773 කින් වැඩිවීමයි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 හඳුනාගත් පාඩු

| විගණන නිරීක්ෂණ | කළමණාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විධායක කමිටුවේ අනුමැතිය ඇතිව සමාලෝචිත වර්ෂය තුළ රු.1,002,258 ක් වටිනා දුනු ශිල්ප උපකරණ ගිණුම් පොත්වලින් කපා හැර තිබුණි. කෙසේ වෙතත්, එක් එක් අයිතමයේ විස්තරය, ප්‍රමාණයන්, පිරිවැය පිළිබඳ විස්තරය විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | මෙම උපකරණය දැනට භාවිතයට ගත නොහැකි තත්ත්වයේ පවතී. | වත්කම් කපා හැරීමට පෙර අවශ්‍ය විස්තර සහ ලේඛන ඉදිරිපත් කළ යුතුය. |

### 3.2 මෙහෙයුම් දුර්වලතා

| විගණන නිරීක්ෂණ | කළමණාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශ |
|---|---|---|
| ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද 2024 ජාතික ක්‍රීඩා දින දර්ශනයට අනුව, සමාලෝචනයට භාජනය වන වර්ෂය තුළ ජාත්‍යන්තර තරඟාවලි 18 ක් පැවැත්වීමට සැලසුම් කර තිබුණි. කෙසේ වෙතත්, එම ජාත්‍යන්තර තරඟාවලි 5 ක් සැලසුම් කළ පරිදි පවත්වා නොතිබුණි. | අපේක්ෂිත ප්‍රතිඵල අත්කර ගැනීමට නොහැකි විය. එබැවින්, සැලසුම් කළ පරිදි ජාත්‍යන්තර තරඟාවලි පවත්වා නොතිබුණි. | සම්මේලනය සැලසුම් කළ පරිදි තරඟාවලි පැවැත්වීමට කටයුතු කළයුතුය. |